# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,113—1960 අප්‍රේල් 23 වැනි සෙනසුරාදා—23.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව**

1949 අංක 48 දරන ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) සංශෝධන පනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධිත 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 9 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, ස්වදේශ කටයුතු සහ ග්‍රාමසංවර්ධන පිළිබඳ ඇමති මොහමඩ් කාසිම් මොහමඩ් කලීල් වන මම මෙයින්—

(1) මෙහි පහත උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් මැතිවරණ කොට්ඨාශ සඳහා II වෙනි හා III වෙනි තීරවල පිළිවෙලින් සඳහන් ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන හා සහකාර ලියා පදිංචි කිරීමේ නිලධාරීන් පත් කරමි ;

(2) තවද පෙර කී වගන්තිය යටතේ මෙහි පහත උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් මැතිවරණ කොට්ඨාශ පිළිබඳ ව 1959 ජූලි 28 වෙනි දින අංක 11,816 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ලියා පදිංචි කිරීමේ නිලධාරී තැන හා සහකාර ලියා පදිංචි කිරීමේ නිලධාරීන් පත් කිරීම් අවලංගු කරමි.

ඇම්. සී. ඇම්. කලීල්,
ස්වදේශ කටයුතු සහ ග්‍රාමසංවර්ධන පිළිබඳ ඇමති.

1960 අප්‍රියෙල් 22 වෙනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| I<br>මැතිවරණ කොට්ඨාශය | II<br>ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන | III<br>සහකාර ලියා පදිංචි කිරීමේ නිලධාරී තැන |
|---|---|---|
| අංක 121—බිබිලේ<br>අංක 129—මොනරාගල | මොනරාගල පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති තැන | මොනරාගල කච්චේරියේ ප්‍රාදේශීය ඉඩම් නිලධාරී තැන<br>මොනරාගල දිස්ත්‍රික්කයේ සහකාර මැතිවරණ නිලධාරී තැන |


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

465—ජේ: ඇන්. ආර් 9353—4,500 (4/60)